**පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

**---------------------------------------------------**

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි අංක 5678 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි 11 වගන්තියේ ඇ (3) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර, පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, රු.මිලියන 7,250 කට සමාන එ.ජ.ඩො.මිලියන 50 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2021 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මතය**

2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සත්‍ය හා සාධාරණ තත්ත්වය දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මාගේ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුලුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිදුවීම් සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමක් ළඟා කර ගන්නේ යන්න ඇගයීම.

මාගේ විගණනයේ දී හඳුනාගත් සැලකිය යුතු විගණන නිරීක්ෂණ, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

# 2 භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අංග 2 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන් ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ත කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයක් කෙරේ.

| සංරචකය | ක්‍රියාකාරකම් | 2018.12.31 දිනට | | ප්‍රතිඵලය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | බලාපොරොත්තු වූ භෞතික කාර්යසාධනය | ළඟා කරගත් කාර්යසාධනය | | | |
| පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන් ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ත කිරීම | නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම | මධ්‍යස්ථාන 28 | - | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සහ පිරිවැය වැඩිකර ගැනීමේ හැකියාව. | ප්‍රසම්පාදන විශේෂඥ සහ ඉංජිනේරු තනතුරුවල අඛණ්ඩ පුරප්පාඩුවක් පැවතීම. | ව්‍යාපෘතියේ අරමුණු සහ ප්‍රතිලාභීන් සඳහා බලාපොරොත්තු වන ප්‍රතිලාභ ළඟා කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්මෙන් නියම කර ඇති ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| | ළමා සංවර්ධන මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම | මධ්‍යස්ථාන 35 | මධ්‍යස්ථාන 15 | - එම - | කොන්ත්‍රාත්කරුවන් විසින් ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රමාදය නිසා | - එම - |
| | නව සෙල්ලම් මිදුල් ඉදිකිරීම | මධ්‍යස්ථාන 35 | මධ්‍යස්ථාන 26 | - එම - | - එම - | - එම - |
| | සෙල්ලම් මිදුල් වැඩිදියුණු කිරීම | මධ්‍යස්ථාන 45 | මධ්‍යස්ථාන 31 | - එම - | - එම - | - එම - |
| | ප්‍රතිලාභ නොලද/ අඩු ප්‍රතිලාභ සහිත ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම | මධ්‍යස්ථාන 25 | - | - එම - | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය නිසා | පළාත් නිලධාරීන් සමඟ නිසි සමබන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |
| | ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා අන්තර් ක්‍රියා වැඩසටහන | වැඩසටහන් 6 | - | - එම - | අනෙකුත් ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම | සම්බන්ධිත නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| පළාත් පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ පද්ධතිය ඒකාබද්ධ කිරීම | පළාත් 9 | - | ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම | ක්‍රියාකාරකම් සංකීර්ණ ස්වරූපයෙන් පවතින අතර, පළපුරුදු උපදේශකයෙකු බඳවා ගැනීම අවශ්‍ය වේ. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් නියම කිරීමට ක්‍රියා කල යුතු බව. |
| පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය සහාය | මධ්‍යස්ථාන 1,500 | 259 | - එම - | පරිපාලන ක්‍රියාපටිපාටි සමඟ අනුගත වීම ප්‍රමාද වීම හේතුවෙන් | - එම - |
| දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් 600 | 350 | - එම - | තෙවන පාර්ශවයන්ගේ අනිවාර්යය සහභාගිත්වය දුර්වලතාවය හේතුවෙන් | අදාල පාර්ශවකරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි සේ ඉලක්ක නියම කිරීමට ක්‍රියා කල යුතුයි. |
| ළමා තක්සේරුකරණ වැඩසටහන් | වැඩසටහන් 3,000 | 116 | - එම - | - එම - | - එම - |